# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

⑤

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
## 11 ශ්‍රේණිය
## ගැලපුම් සටහන් සහිත මූල්‍ය ප්‍රකාශන

1. සුමුදුගේ ව්‍යාපාරයේ 2021.12.31 න් අවසන් වර්ෂයේ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| **විස්තරය** | **හර (රු.)** | **බැර (රු.)** |
|---|---|---|
| 2021.01.01 දිනට තොගය | 6 000 | |
| ගැනුම් | 185 000 | |
| භාණ්ඩ ගෙන ඒමේ කුළී | 4 000 | |
| රක්ෂණ ගාස්තු | 8 000 | |
| ප්‍රචාරණ ගාස්තු | 14 000 | |
| වෙළෙඳ සේවක වේතන | 30 000 | |
| විකුණුම් | | 385 000 |
| කඩ කුළී ගෙවීම් | 20 000 | |
| බැංකු ණය පොළී | 6 000 | |
| බැංකු ගාස්තු | 2 000 | |
| දුන් වට්ටම් | 4 000 | |
| ලැබූ වට්ටම් | | 9 000 |
| ණය ගැතියෝ | 17 000 | |
| ණය හිමියෝ | | 32 000 |
| බෙදා හැරීමේ මෝටර් රථය (පිරිවැයට) | 300 000 | |
| කාර්යාල උපකරණ (පිරිවැයට) | 40 000 | |
| ප්‍රාග්ධනය | | 250 000 |
| මුදල් | 20 000 | |
| වසර 3කින් පසු ගෙවිය යුතු බැංකු ණය | | 50 000 |
| ස්ථාවර තැන්පතු (වසර 05) | 70 000 | |
| | <u>726 000</u> | <u>726 000</u> |

අමතර තොරතුරු පහත දැක්වේ.

1. 2021.12.31 දිනට ඉතිරි බඩු තොගය රු.15 000කි.

2. 2021.12.31 දිනට උපචිත වියදම් පහත දැක්වේ.
   - ප්‍රචාරණය රු.2 000කි.
   - වෙළෙඳ සේවක වේතන රු.3 000කි.



මාතර ව්‍යාපාර අධ්‍යයන කවය

3. බෙදා හැරීමේ වාහන හා කාර්යාල උපකරණ 10% බැගින් පිරිවැය මත ක්ෂය කළ යුතුය.

අවශ්‍ය වන්නේ,

1) 2021.12.31න් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය
2) 2021.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

2. කමල්ගේ ව්‍යාපාරයේ 2021.12.31න් අවසන් වර්ෂය සඳහා ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| **විස්තරය** | **හර (රු.)** | **බැර (රු.)** |
|---|---|---|
| 2021.01.01 දිනට ප්‍රාග්ධනය | | 350 000 |
| මුදල් | 18 000 | |
| විකුණුම් | | 520 000 |
| 2021.01.01 දිනට තොගය | 14 000 | |
| ගැනුම් | 230 000 | |
| යන්ත්‍ර උපකරණ (පිරිවැයට) | 80 000 | |
| බෙදා හැරීමේ මෝටර් රථ (පිරිවැයට) | 600 000 | |
| ගෙන ඒමේ කුලී | 4 000 | |
| ණය ගැතියෝ | 36 000 | |
| ණය හිමියෝ | | 44 000 |
| 10% වසර 4කින් පසු ගෙවිය යුතු බැංකු ණය | | 120 000 |
| බොල් ණය | 4 000 | |
| ගැනිලි | 18 000 | |
| ස්ථාවර තැන්පතු (අවු.5) | 80 000 | |
| විදුලි ගාස්තු | 12 000 | |
| 2021.01.01 ක්ෂය වෙන් කිරීම | | |
| මෝටර් රථ | | 90 000 |
| යන්ත්‍ර උපකරණ | | 16 000 |
| විකුණුම් වියදම් | 35 000 | |
| ලිපි ද්‍රව්‍ය වියදම් | 9 000 | |
| | 1 140 000 | 1 140 000 |

අමතර තොරතුරු පහත දැක්වේ.

1) ස්ථාවර තැන්පතු සඳහා 10%ක වාර්ෂික පොළිය ලැබිය යුතුව ඇත.
2) 2021.12.31 දිනට අවසන් තොගය රු.30 000කි.
3) ණය ගැතියන්ගෙන් රු.1000ක් බොල් ණය කපා හල යුතුය.
4) 2021.12.31 දිනට උපචිත විකුණුම් වියදම් රු.5 000කි.



වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

5) යන්ත්‍ර උපකරණ පිරිවැය මත 10% බැගින් ද බෙදා හැරීමේ මෝටර් රථ පිරිවැය මත 5% ද වාර්ෂිකව ක්ෂය කළ යුතුය.

අවශ්‍ය වන්නේ,

- 2021.12.31න් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය
- 2021.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

3. සුනිමල්ගේ ව්‍යාපාරයේ ගිණුම් වර්ෂය 2021.12.31 දිනෙන් අවසන් වන අතර එදිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| **විස්තරය** | **හර (රු.)** | **බැර (රු.)** |
|---|---|---|
| ගැනුම්/විකුණුම් | 340 000 | 660 000 |
| පරිපාලන වේතන | 34 000 | |
| ගෙන ඒමේ කුළී | 12 000 | |
| 2021.01.01 ප්‍රාග්ධනය | | 300 000 |
| දුන් වට්ටම් හා ලද වට්ටම් | 5 000 | 8 000 |
| බෙදා හැරීමේ වාහන | 500 000 | |
| ණය ගැතියෝ හා ණය හිමියෝ | 65 000 | 82 000 |
| ප්‍රචාරණ වියදම් | 7 000 | |
| ගෙවූ ණය පොළී | 12 000 | |
| ලී බඩු උපකරණ පිරිවැයට | 60 000 | |
| 12% බැංකු ණය (වසර 5කින් ගෙවිය යුතුය) | | 200 000 |
| ප්‍රවාහන වියදම් | 5 000 | |
| 8% ස්ථාවර තැන්පතු | 150 000 | |
| 2021.01.01 ඉතිරි බඩු තොගය | 28 000 | |
| 2021.01.01 දිනට ක්ෂය වෙන් කිරීම | | |
| බෙදා හැරීමේ වාහන | | 50 000 |
| ලී බඩු උපකරණ | | 12 000 |
| විදුලිය | 8 000 | |
| මුදල් හා බැංකු ශේෂය | 44 000 | |
| වෙළෙඳ සේවක වේතන | 42 000 | |
| | 1 312 000 | 1 312 000 |

අමතර තොරතුරු පහත දැක්වේ.

1) 2021.12.31 දිනට අවසන් තොගය රු.35 000කි.
2) ගෙවිය යුතු වියදම් 2021.12.31 දිනට,
   - විදුලිය රු.8 000කි
   - ප්‍රවාහන වියදම රු.2 000කි

3) ලී බඩු උපකරණ හා බෙදා හැරීමේ වාහන පිරිවැය මත 20% බැගින් වාර්ෂිකව ක්ෂය කරයි.

අවශ්‍ය වන්නේ,

1) 2021.12.31 අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශය
2) 2021.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

4. නිමල්ගේ ව්‍යාපාරයේ 2021.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| විස්තරය | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| 2021.01.01 ප්‍රාග්ධනය | | 250 000 |
| මුදල් | 292 000 | |
| බොල් ණය | 4 000 | |
| ප්‍රචාරණ වියදම් | 42 000 | |
| රක්ෂණ ගාස්තු | 6 000 | |
| දුන් වට්ටම් | 8 000 | |
| ලැබූ වට්ටම් | | 5 000 |
| 2021.01.01 දිනට ක්ෂය වෙන් කිරීම් | | |
| ගොඩනැගිලි | | 45 000 |
| උපකරණ | | 6 000 |
| බැංකු ණය | | 80 000 |
| බැංකු ණය පොළී | 8 000 | |
| ගැනුම් | 350 000 | |
| විකුණුම් | | 725 000 |
| ණය ගැතියෝ | 70 000 | |
| ණය හිමියෝ | | 52 000 |
| 2021.01.01 දිනට ඉතිරි බඩු තොගය | 30 000 | |
| ගොඩනැගිලි (පිරිවැය) | 300 000 | |
| ගෙනයාමේ කුලිය | 13 000 | |
| උපකරණ (පිරිවැය) | 40 000 | |
| | 1 163 000 | 1 163 000 |

අමතර තොරතුරු පහත දැක්වේ.

1) ගොඩනැගිලි හා උපකරණ පිරිවැය මත 10%ක ක්ෂය වෙන් කරන්න.
2) ලැබිය යුතු කොමිස් ආදායම් 3 000ක් ගිණුම්ගත කර නැත.
3) බොල් ණය කපා හැරීම රු.5 000කි
4) 2021.12.31 දිනට අවසන් තොගය රු.40 000කි.

අවශ්‍ය වන්නේ,

1) 2021.12.31න් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය
2) 2021.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

5. පූර්ණිමාගේ වෙළෙඳ ව්‍යාපාරයේ 2020.12.31 න් අවසන් වර්ෂය සඳහා ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| විස්තරය | හර රු. | බැර රු. |
|---|---|---|
| 2020.01.01 දිනට තොගය | 28 000 | |
| ගැනුම් | 350 000 | |
| ගෙනඒමේ කුලී | 500 | |
| විකුණුම් | | 450 000 |
| ණයගැතියෝ | 37 000 | |
| ණය හිමියෝ | | 50 000 |
| ආයෝජන | 50 000 | |
| විදුලි ගාස්තු | 25 000 | |
| මුදල් ශේෂය | 40 000 | |
| බැංකු ශේෂය | | 12 000 |
| දුන් වට්ටම් | 1 200 | |
| ලද වට්ටම් | | 2 700 |
| ඉඩම් සහ ගොඩනැගිලි(පිරිවැයට) | 400 000 | |
| ප්‍රචාරණ වියදම් | 20 000 | |
| 8% බැංකු ණය | | 100 000 |
| ප්‍රාග්ධනය | | 337 000 |
| | 951 700 | 951 700 |

අමතර තොරතුරු පහත දැක්වේ.

1. ව්‍යාපාරයේ ඉඩම් වටිනාකම රු. 100 000 ක් වන අතර ගොඩනැගිලි පිරිවැය මත 10% ක් වර්ෂය සඳහා ක්ෂය කල යුතුය.
2. 2020.12.31 දිනට අවසන් තොගය රු. 30 000 කි.
3. 2020.12.31 අවසන් වර්ෂය සඳහා විදුලි වියදම රු. 30 000 කි.
4. 2020.12.31 දිනට ආයෝජන සඳහා 10% ක පොළියක් ලැබිය යුතුව ඇත.

අවශ්‍ය වන්නේ,

1. 2020.12.31 න් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය
2. 2020.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන

6. මධූගේ වෙළෙඳ ව්‍යාපාරයේ 2021.12.31 න් අවසන් වර්ෂය සඳහා ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| විස්තරය | හර රු. | බැර රු. |
|---|---|---|
| ගොඩනැගිලි(පිරිවැයට) | 350 000 | |
| 2021.01.01 දිනට ගොඩනැගිලි ක්ෂය වෙන් කිරීම | | 140 000 |
| 2021.01.01 දිනට තොගය | 30 000 | |
| ගැනුම් | 220 000 | |
| විකුණුම් | | 300 000 |
| ණයගැතියෝ | 40 000 | |
| ණයහිමියෝ | | 30 000 |
| දුන් වට්ටම් | 2 500 | |
| ලද වට්ටම් | | 2 000 |
| විදුලි ගාස්තු | 5 000 | |
| බොල් ණය | 1 500 | |
| 12% බැංකු ණය | | 100 000 |
| බැංකු ණයපොළී | 10 000 | |
| මුදල් ශේෂය | 35 000 | |
| දුරකථන ගාස්තු | 2 000 | |
| ප්‍රාග්ධනය | | 124 000 |
| | 696 000 | 696 000 |

අමතර තොරතුරු පහත දැක්වේ.

1. 2021.12.31 දිනට ඉදිරියට ගෙවූ විදුලි වියදම් රු. 1 000 ක් පොත්වල සටහන් කර නැත.
2. ගොඩනැගිලි පිරිවැය මත 10% බැගින් වාර්ෂිකව ක්ෂය කරයි.
3. තවත් බොල්ණය රු. 1 000 ක් කපාහරින්න.
4. 2021 වර්ෂය සඳහා ලාභාංශ ආදායම් රු.1 500 ක් ලැබිය යුතුව ඇත.
5. ගෙවිය යුතු දුරකථන වියදම රු. 500 කි.
6. 2021.12.31 දිනට අවසන් තොගය රු. 30 000

අවශ්‍ය වන්නේ,

1. 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය
2. 2021.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය.

7. දසුන්ගේ ව්‍යාපාරයේ 2021.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| විස්තරය | හර රු. | බැර රු. |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 500 000 |
| බඩු තොගය(2021.12.31) | 10 000 | |
| ගැනුම් | 280 000 | |
| විකුණුම් | | 350 000 |
| ණයගැතියෝ | 30 000 | |
| ණයහිමියෝ | | 13 000 |
| 15% බැංකු ණය | | 50 000 |
| ඉඩම් ගොඩනැගිලි(පිරිවැයට) | 400 000 | |
| යන්ත්‍ර (පිරිවැය) | 150 000 | |
| බැංකු ණය පොළිය | 3 000 | |
| පරිපාලන වේතන | 14 000 | |
| දුන් වට්ටම් | 3 200 | |
| ලද වට්ටම් | | 5 000 |
| වරිපනම් | 8 000 | |
| ප්‍රචාරණය | 12 500 | |
| අතැති මුදල් | 7 300 | |
| | 918 000 | 918 000 |

අමතර තොරතුරු

1. 2021.12.31 දිනට ඉතිරි තොගය රු.15 000 කි.
2. බැංකු ණය ලබාගෙන ඇත්තේ 2021.04.01 දිනදීය.
3. ව්‍යාපාරයට ලාභාංශ ආදායම් රු. 5 000 ක් තවමත් ලැබී නැත.
4. ව්‍යාපාරයේ ණයගැතියන් රු. 4 000 ක් බොල්ණය වී ඇත.
5. මාසික වරිපනම් වියදම රු. 1 000 ක් වේ.
6. යන්ත්‍ර වාර්ෂිකව 15% ක් පිරිවැය මත ක්ෂය කරනු ලබයි.

අවශ්‍ය වන්නේ,

1. 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය
2. 2021.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය.

8. සුමන්ගේ වෙළෙඳ ව්‍යාපාරයේ 2021.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| විස්තරය | හර රු. | බැර රු. |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 250 000 |
| බෙදාහැරීමේ රථ(පිරිවැයට) | 250 000 | |
| බෙදාහැරීමේ රථ ක්ෂය වෙන් කිරීම (2021.01.01 දිනට) | | 30 000 |
| තොගය(2021.01.01 දිනට) | 35 000 | |
| 12% බැංකු ණය | | 50 000 |
| රක්ෂණ ගාස්තු | 12 000 | |
| විකුණුම් | | 220 000 |
| ගැනුම් | 170 000 | |
| ණයගැතියෝ | 30 000 | |
| ණයහිමියෝ | | 40 000 |
| ලද වට්ටම් | | 4 000 |
| දුන් වට්ටම් | 2 500 | |
| බැංකු ණයපොළී | 4 000 | |
| බොල්ණය | 1 000 | |
| විදුලි ගාස්තු | 1 500 | |
| වරිපනම් | 2 000 | |
| පරිපාලන වියදම් | 6 000 | |
| මුදල් ශේෂය | 30 000 | |
| ස්ථාවර තැන්පතු | 50 000 | |
| | 594 000 | 594 000 |

අමතර තොරතුරු

1. 2021.12.31 දිනට ඉතිරි තොගය රු. 30 000 කි.
2. 2021.04.01 දින ස්ථාවර තැම්පතු ආරම්භ කර ඇත. ඒ සඳහා වාර්ෂිකව 12% ක පොළියක් ලැබිය යුතුව ඇත.
3. 2021.12.31 දිනට උපචිත රක්ෂණ වියදම රු. 2 000 කි.
4. බෙදාහැරිමේ රථ වාර්ෂිකව පිරිවැය මත 10% ක්ෂය කරනු ලබයි.

අවශ්‍ය වන්නේ,

1. 2021.12.31 න් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය
2. 2021.12.31දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

9. නුවන්ගේ වෙළෙඳ ව්‍යාපාරයේ 2021.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| විස්තරය | හර රු. | බැර රු. |
|---|---|---|
| ඉඩම් ගොඩනැගිලි (පිරිවැයට) | 300 000 | |
| ප්‍රාග්ධනය | | 500 000 |
| බෙදාහැරීමේ රථය(පිරිවැයට) | 400 000 | |
| බෙදාහැරීමේ රථ ක්ෂය වෙන් කිරීම (2021.01.01 දිනට) | | 60 000 |
| තොගය(2021.01.01 දිනට) | 25 000 | |
| 9% බැංකු ණය | | 100 000 |
| ගැනුම් | 150 000 | |
| විකුණුම් | | 240 000 |
| වේතන | 8 000 | |
| ණයගැතියෝ | 20 000 | |
| ණයහිමියෝ | | 12 000 |
| ලද වට්ටම් | | 8 000 |
| දුන් වට්ටම් | 1 000 | |
| ගෙනඒමේ කුලී | 1 500 | |
| ගෙවූ බැංකු ණයපොලී | 4 500 | |
| බොල්ණය | 800 | |
| විදුලි ගාස්තු | 2 000 | |
| වරිපනම් | 200 | |
| මුදල් ශේෂය | 7 000 | |
| | 920 000 | 920 000 |

අමතර තොරතුරු

1. ව්‍යාපාරය දෙසැම්බර් මාසයේ රු. 3 000 ක විදුලි වියදම 2021.12.31 දින වන විට ගෙවා නොතිබුණි.
2. 2021.12.31 දිනට අවසන් තොගය රු. 10 000 කි.
3. ණයගැතියන්ගෙන් තවත් රු. 2 000 ක බොල්ණය කපා හැරීමට තීරණය කර ඇත.
4. මෝටර් රථ පිරිවැය මත වාර්ෂිකව 10% බැගින් ක්ෂය කරයි.
5. වාර්ෂික වේතන වියදම රු. 10 000 කි.

අවශ්‍ය වන්නේ,

1. 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය
2. 2021.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

10. පසන්ගේ ව්‍යාපාරයේ 2021.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| විස්තරය | හර රු. | බැර රු. |
|---|---|---|
| විකුණුම් | | 450 000 |
| ණයගැතියෝ | 40 000 | |
| ණයහිමියෝ | | 30 000 |
| ගැනුම් | 280 000 | |
| ගෙනඒමේ කුලී | 5 000 | |
| තොගය(2021.01.01 දිනට) | 25 000 | |
| බොල්ණය | 3 000 | |
| විදුලි ගාස්තු | 4 000 | |
| සේවක වැටුප් | 15 000 | |
| 10% බැංකු ණය | | 100 000 |
| බැංකු ණය පොළී | 2 000 | |
| දුන් වට්ටම් | 8 000 | |
| ඉඩම් | 100 000 | |
| මෝටර් රථ | 200 000 | |
| මෝටර් රථ ක්ෂය වෙන් කිරීම(2021.01.01 දිනට) | | 80 000 |
| මුදල් ශේෂය | 50 000 | |
| ප්‍රාග්ධනය | | 72 000 |
| | 732 000 | 732 000 |

අමතර තොරතුරු පහත දැක්වේ.

1. 2021.12.31 දිනට අවසන් තොගය රු. 18 000 කි.
2. 2021 වර්ෂයේ බොල්ණය කපාහැරීම රු. 3 000 කි.
3. බැංකු ණය ලබාගෙන ඇත්තේ 2021.07.01 දිනය.
4. මෝටර් රථ වාර්ෂිකව පිරිවැය මත 15% ක් ක්ෂය කරයි.

අවශ්‍ය වන්නේ,

1. 2021.12.31 අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය
2. 2021.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය.

ව්‍යාපාර අධ්‍යයන ශාඛාව